තක්ෂිලා මධ්‍ය විද්‍යාලය- හොරණ

පළමු වාර පරීක්ෂණය - 2022

ජීව විද්‍යාව I | 13 ශ්‍රේණිය | කාලය- පැය 02

01. ජීවින් සතු ලාක්ෂණික ලක්ෂණ පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය වනුයේ ,
   1. ප්‍රවේණික ද්‍රව්‍යවල සිදුවන විකරණවලට අනුකූලව කාලයත් සමග ජීවින්ට වෙනස්වීමට ඇති හැකියාව ආවේණියයි.
   2. අප්‍රතිවර්ත්‍ය ලෙස වියළි බරෙහි සිදුවන වැඩිවීම වර්ධනයයි.
   3. ජීවින් චලනය දක්වන්නේ උද්දීප්‍යතාවයේ හා සමායෝජනයේ ප්‍රතිඵලයක් ලෙසයි.
   4. පරිසර පද්ධතියක සිදුවන සියලු රසායනික ක්‍රියාවල සමස්ථය පරිවෘත්තියයි.
   5. බහුතර අජීවී ද්‍රව්‍ය ජීවින් සතු ලාක්ෂණික ලක්ෂණ කීපයක් එකවර නොපෙන්වයි.

02. හෙක්සෝස සීනි බහු අවයවීකරණයෙන් තැනුන ශාකවල ව්‍යුහමය කෘත්‍ය ඉටුකරන පොලිසැකරයිඩයකි.
   1. පිෂ්ඨය
   2. හෙමි සෙලියුලෝස්.
   3. ඉනියුලින්
   4. සෙලියුලෝස්
   5. පෙක්ටින්

03. ප්‍රෝටීන් පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
   1. ප්‍රෝටීනවල ප්‍රාථමික ව්‍යුහය නිශ්චිත කෘත්‍යයක් ඉටු කිරීමට සැකසුණු ව්‍යුහයකි.
   2. ඇමයිනෝ අම්ල උභයසාහි අණු වේ.
   3. එකම පොලිපෙප්ටයිඩ දාමයේ O පරමාණු හා N පරමාණු අතර ඇතිවන අන්තර් අණුක හයිඩ්‍රජන් බන්ධන මගින් ද්විතීක ව්‍යුහය ගොඩනැගේ.
   4. ප්‍රෝටීනවල තෘතියික ව්‍යුහය තැනීමට තනි පොලිපෙප්ටයිඩ දාමයක් සහභාගී වේ.
   5. ප්‍රෝටීනවල මූල ද්‍රව්‍ය සංයුතිය C ,H, O , N ,P ය.

04. සංයුක්ත ආලෝක අන්වීක්ෂයේ කොටස් හා කෘත්‍ය අතර නිවැරදි සම්බන්ධය දක්වන්නේ,
   1. දර්පණය - ආලෝක කිරණ නාභිගත කර ප්‍රතිබිම්බය සෑදීම.
   2. උපනෙත - නිදර්ශකයේ පළමු විශාලිත ප්‍රතිබිම්බය සෑදීම.
   3. සංඝනීකාර කාචය - ආලෝක කිරණ සමාන්තර කර නිදර්ශකය වෙත යොමු කිරීම.
   4. අවනෙත් කාචය - නිදර්ශකයේ දෙවන විශාලිත ප්‍රතිබිම්බය සෑදීම.
   5. ප්‍රාචීරය - නිදර්ශකය නිරීක්ෂණයට ඇස තැබීමට

05. ඇමයිනෝ අම්ල 125 කින් යුත් ප්‍රෝටීනයක් සෑදීමට දායක වූ ජානය අන්තර්ගත DNA කොටසහි නියුක්ලියෝටයිඩ සංඛ්‍යාව වනුයේ
   1. 125
   2. 300
   3. 375
   4. 750
   5. 1500

.22 A/L අපි [papers grp].

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

06. ප්ලාස්ම පටලය පිළිබඳව පිළිගත හැකි වගන්තිය වන්නේ

1. අහඹු ලෙස පිහිටන ප්‍රෝටීන පටලයට තරලමය බව ලබා දේ.
2. සියළුම සෛලවල ප්ලාස්ම පටලයේ ලිපිඩ ද්විත්ව ස්ථරයේ අහඹුව ඒකාබද්ධ වූ කොලෙස්ටරෝල් අණු පවතී.
3. පර්යන්ත ප්‍රෝටීන පිටත පෘෂ්ඨයට ලිහිල්ව බැඳී පවතී.
4. පොස්පොලිපිඩ හිස සෛල සැකිලි තන්තු හා බැඳී සෛලයේ හැඩය පවත්වා ගනී.
5. ප්ලාස්ම පටලයේ ගිළුණු ප්‍රෝටීන සෛල හඳුනා ගැනීමට දායක වේ.

07. එන්සයිම පිළිබඳ පහත ප්‍රකාශ අතුරින් සත්‍ය වනුයේ .

1. එන්සයිම සියල්ල තාප සංවේදී වේ.
2. එන්සයිම මගින් උත්ප්‍රේරණය කරන ප්‍රතික්‍රියා සියල්ල ප්‍රතිවර්ත්‍ය වේ.
3. එන්සයිම සෑදීමට දායක වන ඇමයිනෝ අම්ල වලින් බහුතරය එන්සයිමයේ හැඩය පවත්වා ගනී .
4. එන්සයිම උත්ප්‍රේරිත ප්‍රතික්‍රියාවක් සිදුවන පටු pH පරාසය එම එන්සයිමයේ ප්‍රශස්ත pH අගයයි.
5. ඇලොස්ටෙරික යාමනය මගින් යාමනය වන සියළුම එන්සයිම උප ඒකක 2 කින් සෑදී ඇත.

08. සෛලයක ඌනන සහ අනූනන විභාජන සම්බන්ධව කවර ප්‍රකාශය සත්‍ය වේද?

1. සමජාත වර්ණදේහ යුගල යෝග කලා තලය මත තැන්පත් වීම.
2. සමජාත වර්ණදේහාංශ සෙන්ටොමියරයෙන් වෙන් වීම.
3. ප්‍රවේණිකව සර්වසම නොවන සහෝදර වර්ණදේහාංශ සෙන්ටොමියරයෙන් වෙන්වීම.
4. වියෝග කලාවේදී කයිනෙටකෝර් ක්ෂුද්‍ර නාලිකා කෙටිවීම.
5. අන්තකලාව අවසානයේ ප්‍රවේණිකව සර්වසම නොවන න්‍යෂ්ටි දෙකක් ඇතිවීම.

09. උසස් භෞමික ශාකයක ප්‍රභාසංශ්ලේෂණයේ ආලෝක ප්‍රතික්රියාව හා සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වන්නේ

1. පත්‍ර මධ්‍ය සෛලවල හරිතලව පංජරයේදී ATP හා NADPH සංශ්ලේෂණය වේ.
2. ඉලෙක්ට්‍රෝන ප්‍රතිග්‍රාහක ශ්‍රේණියක් ඔස්සේ ගමන් කරමින් ATP සංශ්ලේෂණය කරයි.
3. ජලය එන්සයිමීය ජලවිච්ඡේදනයෙන් නිදහස්වන ඉලෙක්ට්‍රෝන උද්දීපනය වූ PSI උදාසීන කරයි.
4. ප්‍රභා පද්ධති 1 හි ප්‍රභා උද්දීපනය වූ ඉලෙක්ට්‍රෝන චක්‍රිය ඉලෙක්ට්‍රෝන පථය හරහා ගමන් කර NADPH සාදයි.
5. ප්‍රභා ආරක්ෂණයට කැරොටීන් මෙන්ම ක්ලොරොෆිල් දායක වේ.

10. වර්තමාන වර්ගීකරණ පද්ධතියට පාදක වී ඇති ප්‍රධාන නිර්ණායකයක් ලෙස පිළිගත නොහැක්කේ

1. වැදගත් ජානවල DNA භෂ්ම අනුපිළිවෙල
2. වැදගත් ප්‍රෝටීනවල ඇමයිනෝ අම්ල අනුපිළිවෙල
3. මයිටකොන්ඩ්‍රියා, හරිතලවවල DNA භෂ්ම අනුපිළිවෙල
4. රයිබසෝම RNA හි භෂ්ම අනුපිළිවෙල
5. සෛලීය සංඝටකවල අණුක ව්‍යුහය

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

11. DNA සමඟ බැඳුණු හිස්ටෝන ප්‍රෝටීන දරන, ප්‍රෝටීන සංශ්ලේෂණයට ආරම්භක ඇමයිනෝ අම්ලය ලෙ මෙතියොනින් දායක වන RNA පොලිමරේස් බොහෝ ආකාර සහිත ගණනාම නිවැරදි අනුපිළිවෙල වන්නේ

1. *Anabaena*	*Methanococcus*	*Cycas*
2. *Paramecium*	*Anabaena*	*Taenia*
3. *Saccharomyces*	*Halobacterium*	*Ulva*
4. *Cycas*	*Penicillium*	*Nostoc*
5. *planaria*	*Thermococcus*	*Nostoc*

12. ප්‍රොටිස්ටා රාජධානිය සතු ව්‍යුහ හා ලක්ෂණ කිපයක් පහත දැක්වේ.

A. බහු සෛලිකය

B. සෛල බිත්ති දැරීම

C. ප්‍රභා සංශ්ලේෂක වර්ණක ලෙස ක්ලෝරොෆිල් a හා d දැරීම.

D. සංකෝචක රික්තක දැරීම

ඉහත ලක්ෂණ පිළිවෙලින් දරන ජීවී අනුපිළිවෙල වන්නේ,

1. *Ulva*	*Amoeba*	*Gelidium*	*Paramecium*
2. *Sargassum*	Diatom	*Ulva*	*Amoeba*
3. *Ulva*	*Sargassum*	Diatom	*Gelidium*
4. *Gelidium*	*Paramecium*	Diatom	*Ulva*
5. *Ulva*	*Sargassum*	*Gelidium*	*Euglena*

13. ප්ලාන්ටේ රාජධානිය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වනුයේ

1. පෘතුවියේ පවතින ශාක විශේෂ අතුරින් 93% ක් සනාල ශාක වේ.
2. සනාල ශාකවල පූර්වජයන්ගේ ජන්මාණු ශාක හා බීජානු ශාක විශාලත්වයෙන් සමානය.
3. සනාල ශාකවලට සමීප පරිණාමික බන්ධුතාවයක් දක්වන විනාල ශාක වංශය Bryophyta වේ.
4. ලූටරෝෆයිටා හා බීජ ශාකවලට අදාළ පොදු පූර්වජයකු මෑත කාලයේ සොයා ගන්නා ලදී.
5. බීජ රහිත සනාල ශාක බොහොමයක් එක් වර්ගයක බීජාණු නිපදවයි.

14. පහත සඳහන් ව්‍යුහ දරන සත්ත්වයින් නිවැරදි අනුපිළිවෙලින් අන්තර්ගත වරණය තෝරන්න.

a. ග්‍රාහිකා

b. සිලින්ඩරාකාර දේහ

c. අභ්‍යන්තර කවච

d. සංවෘත සංසරණ පද්ධතිය

1. මුහුදු මල, ගැඩවිලා, දැල්ලා, බංගුර තාරකාවා
2. මයිටා, *Hydra*, බූවල්ලා, පත්තෑයා
3. වැරහැලි පණුවා, හැකරැල්ලා, බූවල්ලා, පත්තෑයා
4. කිරි පණුවා, පත්තෑයා, භංගුර තාරකාවා, කුඩැල්ලා
5. ගොළුබෙල්ලා, *Taenia*, මුහුදු කාසි, ගැඩවිලා

.22 A/L අපි [papers grp].

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

15. අවලතාපී කුටීර 04 ක හෘදයක් සහිත අභ්‍යන්තර සංසේචනය දක්වන කෝඩේටා වංශයේ සාමාජිකයින් ඇතුළත් නිවැරදි වරණය වනුයේ,

1. කපුටා සහ කටුස්සා
2. වවුලා සහ කිඹුලා
3. රාජාලියා සහ වවුලා
4. කැස්බෑවා සහ කපුටා
5. වඳුරා සහ කටුස්සා

16. සියළුම බීජ ශාකවල වැදගත් ලක්ෂණයක් වන්නේ

1. ක්ෂීන වූ ජන්මානු ශාඛයක් තිබීම
2. ඩිම්බ හා අණ්ඩ නිපදවීම
3. බීජ හා ඵල නිපදවීම
4. පරාග කණිකා හා ශුක්‍රාණු නිපදවීම
5. බීජානුධානියක තනි කෘත්‍යමය මහා බීජාණුවක් පැවතීම

1. වර්මීය පටක පද්ධතිය පිළිබඳ පිළිගත හැක්කේ

1. ශාකයේ සෑම කොටසකටම ආරක්ෂක වැස්ම ලෙස ක්‍රියා කිරීම
2. මුලේ අපිවර්මීය කේශර පැවතීම
3. කඳ මුල් හා පත්‍ර උච්චර්මයෙන් ආවරණය වීම
4. ප්‍රාථමික ශාක දේහයේ කඳ හා මුලට ආරක්ෂාව සැපයීම
5. ලිහිල්ව ඇසුරුණු තනි සෛල ස්ථරයක් ලෙස පැවතීම

18. උත්ස්වේදනය වැඩි වීම සඳහා බලපාන සාධකයක් නොවන්නේ

1. ආලෝක තීව්‍රතාව වැඩිවීම
2. උෂ්ණත්වය වැඩිවීම
3. ආර්ද්‍රතාව වැඩිවීම
4. සුළඟේ වේගය වැඩිවීම
5. CO_2 සාන්ද්‍රණය වැඩිවීම

19. ශාකයට අවශ්‍ය කරන පහත සඳහන් මූලද්‍රව්‍ය වලින් අංශු මාත්‍ර මූලද්‍රව්‍යයක් හා එහි එන්සයිම සම්බන්ධ බලපෑම පිළිබඳ පිළිගත නොහැක්කේ

1. Zn - බොහෝ එන්සයිම සක්‍රීය කරයි.
2. Mg - බොහෝ එන්සයිම සක්‍රීය කරයි.
3. Cu - සමහර එන්සයිම සක්‍රීය කරයි.
4. B - හරිතප්‍රද සංශ්ලේෂණයේ සහ සාධකයකි.
5. Cu - සමහර එන්සයිමවල සංඝටක වේ.

20. Cycas පුංජන්මාණු- ශාකය පිළිබඳ සාවද්‍ය වන්නේ

1. පරාග නාලය බෙදී ඇත.
2. ජායා ජන්මාණු ශාකයේ කුක්ෂියෙන් පෝෂක අවශෝෂණය කරයි.
3. ශුක්‍රාණු නිදහස් කිරීමට පරාග නාලය වැදගත් වේ.
4. පරාග කණිකා පුංජන්මාණු ශාකය බවට පත්වේ.
5. කෙටි ජීවිත කාලයක් ඇත.

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

21. බීජ සම්බන්ධව පිළිගත නොහැක්කේ

1. සනාල ශාකවල ව්‍යාප්ති ඒකකය වන්නේ බීජයයි.
2. බීජයේ සංචිත ආහාර විකසනයේදී කලලයට පෝෂණය සපයයි.
3. අහිතකර පරිසර තත්ත්ව වලදී නොනැසී පැවතීමට බීජවල සුප්තතාව වැදගත් වේ.
4. භෞමික ජීවිතයක් සඳහා බීජ විලාශයට උපාය මාර්ග ඇත.
5. බීජ සුප්තතාවයට ප්‍රබලතම හේතුවක් ලෙස නිශේධක පැවතීම සැලකිය හැකිය.

22. ශාක වර්ධක ද්‍රව්‍යයක් නොවන්නේ

1. ගිබරලින්
2. ඇසටොකයි නීන්
3. ඇබසයික් අම්ලය
4. ජැස්මොනේට
5. එතලීන

23. *Nephrolepis* බීජාණු ශාකය

1. පරිණත පත්‍රිකාවල උඩු පැත්තේ සොරස් දක්නට ලැබේ.
2. වායු හුවමාරුව සඳහා පූටිකා විකාසනය වී නැත.
3. ප්‍රභාසංශ්ලේෂක පරාධීන ශාකයකි.
4. මූලාභ දක්නට නොලැබේ.
5. පරිණතවන විට සොරස හැලීයයි.

24. ජලය හා ද්‍රව්‍ය පරිවහන ක්‍රම සම්බන්ධව නිවැරදි නොවන්නේ

1. විසරණය, සාන්ද්‍රණය අනුක්‍රමයක් ඔස්සේ සිදුවන ක්‍රියාවලියකි.
2. ආස්‍රැතිය වරණීය පාරගම්‍ය පටලයක් හරහා නිදහස් ජල අණු විසරණය වීම.
3. නිපානය ජලකාමී ද්‍රව්‍ය මගින් ජලඅණු භෞතිකව අවශෝෂණය කර ගැනීමකි.
4. පහසුකල විසරණය ජලය හා ජලකාමී ද්‍රව්‍යය පටල හරහා පිහිටා ඇති පරිවහන ප්‍රෝටීන අණුවල ආධාරයෙන් අක්‍රියව පටල හරහා ගමන් කිරීමකි.
5. තොග ප්‍රවාහය පටලයක් හරහා සිදු නොවන ක්‍රියාවලියකි.

25. රසෝද්ගමනය සම්බන්ධව පිළිගත නොහැක්කේ

1. රසෝද්ගමනය සඳහා ජල අණුවල සංසක්තිය හා ආසක්තිය වැදගත් වේ.
2. උත්ස්වේදන චූෂණය ප්‍රධාන ලෙස බලපායි.
3. ශාකයේ දෙදිශාවටම සිදු නොවේ.
4. ශෛලම යුෂයට බලපාන ආතති බල පත්‍රයේ සිට මුල් දක්වා සහ පස තුලට පවා සම්ප්‍රේෂණය වේ.
5. සාන්ද්‍රණය වැඩි අවස්ථාවේ දී ශෛලමය යුෂය ඉහල නැංවීමට ඇතැම් විට ශක්තිය වැය විය හැක.

26. අපිච්ඡද පටක වර්ගය හා උදාහරණ නොගැළපෙන්නේ

1. සරල ශල්කමය අපිච්ඡදය - ගර්ත ආස්තරණය
2. ව්‍යාජ ස්ථරීභූත ස්ථම්භිත අපිච්ඡදය - කුඩා අනුශ්වාසනාලිකා
3. සරල ස්ථම්භික අපිච්ඡදය - ග්‍රහනිය
4. ස්ථරීභූත ශල්කමය අපිච්ඡදය - ගුද ආස්තරණය
5. සරල ඝනකාර අපිච්ඡදය - අවිදූර සංවලිත නාලිකාව

.22 A/L අපි [papers grp].
Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

27. ජීර්ණය කල හැකි කාබොහයිඩ්‍රේටවල කෘත්‍යයක් නොවන්නේ
1. ප්‍රෝටීන ඉතුරු කිරීම පහසු කිරීම.
2. ශක්තිය ලබා දීම.
3. ශක්ති සංචිතයක් ලෙස ක්‍රියා කිරීම.
4. ග්ලයිකෝජන් නිදහස් කිරීම.
5. අතිරික්තය මේද බවට පරිවර්තනය කිරීම.

28. මිනිසාට පොටෑසියම් හිඟතාව නිසා ඇතිවිය හැකි ඌණතා ලක්ෂණයන් ලෙස පිළිගත නොහැක්කේ
1. දුර්වල විකාසනය
2. පේශී දුර්වල වීම
3. ඔක්කාරය
4. අංශභාගය
5. හෘදය අකර්මන්‍ය වීම

29. ඒක සංසරණය නොපෙන්වන සතුන් වන්නේ
A. මඩුවා
B. මෝරා
C. *Ichthyophis*
D. කාපයා

1. A සහ B පමණි.
2. C සහ D පමණි.
3. A .B සහ D පමණි.
4. C පමණි.
5. ඉහත සියල්ලම

30. ශ්වසන වර්ණක සම්බන්ධව වැරදි ප්‍රකාශය වන්නේ
1. මයෝග්ලොබින් අස්ථික මත්ස්‍යයින්ට නැත.
2. හිමොග්ලොබින් ක්‍රස්ටේසියාවන්ට ඇත.
3. ක්ලෝරොක්වෝරීන් ඇනලිඩාවන්ට ඇත.
4. හිමොඑරිත්‍රින් ඇනලිඩාවන්ට නැත.
5. හිමෝසයනින් උරගයින්ට ඇත.

31. හෝමෝනය සහ එහි ප්‍රධාන කෘත්‍ය වැරදිව ගළපා ඇත්තේ පහත සඳහන් කුමන ප්‍රතිචාරයේ ද?
1. තයිමෝසීන් - සහජ ප්‍රතිශක්තිය යාමනය කරයි.
2. නොඇඩ්‍රිනලීන්- කෙටිකාලීන ආතති ප්‍රතිචාර වලට මැදිහත් වීම
3. කෝටිසෝල් - ග්ලූකෝස් පරිවෘත්තියට මැදිහත් වීම
4. පැරාතයිරොයිඩ හෝමෝනය (PIH) - රුධිරයේ Ca මට්ටම ඉහළ දමයි
5. ඔක්සිටොසීන්- සිනිඳු පේශී සංකෝචය

32. සිරස් අක්ෂයට ලම්බකව වැරෝලිසේතුව හරහා ගත් තිරස් කඩක දැකිය හැක්කේ පහත සඳහන් ඒවායින්
A. 3වන මස්තිෂ්ක කෝෂිකාව
B. අනුමස්තිෂ්කය
C. සුෂුම්නා ශීර්ෂකය
D. පිටියුටරිය
E. කේතු දේහය

1. A හා B පමණි.
2. A හා D පමණි.
3. A, D හා E පමණි.
4. B හා D පමණි.
5. B පමණි.

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

33. බ්ලාස්ටොසිස්ටය මවගේ ගර්භාශයික එන්ඩෝමෙට්‍රියමේ තැන්පත් වන්නේ සංසේචනයෙන් දින කීයක් අතරතුර ද?

1. 3
2. 4
3. 5-6
4. 7
5. 8-10

34. සිෆිලිස් වල රෝග ලක්ෂණයක් ලෙස පිළිගත නොහැක්කේ

1. වේදනාකාරී නොවන වන ඇති වීම.
2. සමේ කුෂ්ට ඇති වීම.
3. දේහයේ ඕනෑම ස්ථානයක වන හෝ බිබිලි ඇතිවීම.
4. දීර්ඝකාලීනව පවතින වියලි කැස්ස
5. උණ ඇතිවීම.

35. හිස් කබල තුල අන්තර්ගත නොවනුයේ

1. හයිපොතැලමස
2. කේතු දේහය
3. පිටියුටරිය
4. තයිමස
5. වැරෝලිසේතුව

36. කිරි උරා බීම සංවේදක නියුරෝන →හයිපොතැලමස → A → ස්නායු ශ්‍රාවී සෛල → B → C

ABC පිළිවෙලින් දැක්වෙන්නේ

1. පූර්ව පිටියුටරිය , ඔක්සිටොසින් , සිනිඳු පේශී (ක්ෂීර ග්‍රන්ථි තුල)
2. අපර පිටියුටරිය , ප්‍රෝලැක්ටින් , ක්ෂීර ග්‍රන්ථි
3. අපර පිටියුටරිය , ඔක්සිටොසින් , සිනිඳු පේශී (ක්ෂීර ග්‍රන්ථි තුල)
4. පූර්ව පිටියුටරිය , ඔක්සිටොසින් ,ඉලක්ක සෛල
5. අපර පිටියුටරිය , ඔක්සිටොසින් , ක්ෂීර ග්‍රන්ථි

37. කලලය සෘජුවම එන්ඩොමෙට්‍රියමෙන් පෝෂණය ලබන්නේ කලල විකසනයේ කුමන කාල අතරතුද?

1. පළමු සති 1
2. පළමු සති 1-2
3. පළමු සති 2-5
4. පළමු සති 2-4
5. පළමු සති 3

38. පුරුෂ ප්‍රජනක පද්ධතියේ ප්‍රධාන අභ්‍යන්තර ව්‍යුහයක් නොවන්නේ

1. අපි වෘෂණ
2. වෘෂණ කොෂ
3. ප්‍රොස්ටේට් ග්‍රන්ථිය
4. විසර්ජක ප්‍රණාලය
5. ශුක්‍ර ආශයිකා

.22 A/L අපි [papers grp].

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

39. LH වල කෘත්‍යයක් නොවන්නේ

1. ඩිම්බ මෝචනය
2. ඩිම්බ කෝෂය තුළ පීත දේහය සෑදීම ප්‍රවර්ධනය
3. ඩිම්බ කෝෂයෙන් ප්‍රොජෙස්ටරෝන් ශ්‍රාවය උත්තේජනය
4. ලේඩිග් සෛල වලින් ටෙස්ටොස්ටෙරෝන් ශ්‍රාවය උත්තේජනය
5. ඇන්ඩ්‍රොජන් හෝමෝන ශ්‍රාවය උත්තේජනය

40. අනුවේගී ස්නායු පද්ධතියේ කාර්යයක් ලෙස සැලකෙන්නේ

1. පිත්තාශයේ ක්‍රියාවලිය උත්තේජනය
2. මුත්‍රාශයේ හිස්වීම දිරි ගැන්වීම
3. ලිංගේන්ද්‍රියන් උත්ථානය දිරි ගැන්වීම
4. අධිවෘක්ක බාහිකය නිශේධනය
5. පෙනහැලි තුල ඇති ශ්වාසනාලිකා සංකෝචනය කරයි.

- අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදිය.
  කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදිද යන්න පළමුවෙන්ම විනිශ්චය කරගන්න.ඉන් පසු නිවැරදි අංකය තෝරන්න.

1	2	3	4	5
A , B. D නිවැරදිය	A , C ,D නිවැරදිය	A ,B නිවැරදිය	C ,D නිවැරදිය	වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදිය

41. නියුක්ලෙයික් අම්ල සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය / ප්‍රකාශ මොනවාද?

A. නියුක්ලෙයික් අම්ල තැනීම සඳහා නියුක්ලියෝටයිඩ පහක් සහභාගී වේ .
B. නියුක්ලෙයික් අම්ල සෑදීමට සහභාගී වන ඇඩිනීන් නයිට්‍රජනීය භෂ්මයේ විශාලත්වය සයිටොසීන් හි විශාලත්වයට වඩා වැඩිය.
C. සෛලයක අඩුවෙන්ම පවතින රයිබෝනියුක්ලෙයික් අම්ල ආකාරය වන්නේ t RNA ය.
D. නියුක්ලෙයික් අම්ල අණු සෑදීමේදී ඇඩිනීන් හා යුරැසිල් අතර බන්ධන ඇතිවිය නොහැක.
E. පොස්ෆේට් කාණ්ඩය මගින් නියුක්ලෙයික් අම්ල වලට ආම්ලික ස්වභාවයක් ලබා දේ.

42. ප්‍රභාසංශ්ලේෂණයේ C_4 පථය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ නිවැරදිද?

A. කාබොක්සිල්හරණ එන්සයිම සහභාගී වේ.
B. පත්‍ර මධ්‍ය සෛල තුල PEP නිපදවීමට අවශ්‍ය පයිරුවේට් කලාප කොපු සෛලවල සිට විසරණය වේ
C. පත්‍ර මධ්‍ය සෛල තුලදී කාබන් CO_2 ලෙස ප්‍රතිග්‍රහණය PEP කාබොක්සිලේස් එන්සයිමය මගින් උත්ප්‍රේරණය කරයි.
D. කලාප කොපු සෛල තුල O_2 නිපදවීමක් සිදු නොවේ .
E. C_4 ප්‍රභාසංශ්ලේෂණය සඳහා ප්‍රශස්ථ උෂ්ණත්වය (15-25)C^0 අතර වේ .

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

43. බැක්ටීරියා අධිරාජධානියේ ලක්ෂණ සම්බන්ධයෙන් වඩාත් සත්‍ය ප්‍රකාශ වන්නේ

A. අනූනනය මගින් සිදුවන වේගවත් ප්‍රජනනය

B. බහුතරය 0.5- 5μm තරමින් යුතු වීම

C. සියල්ලෝම පෙප්ටිඩෝග්ලයිකෑන් සංඝටකයක් ලෙස පවතින සෛල බිත්ති දැරීම

D. වැඩි දෙනෙකුගේ සෛල බිත්ති ප්‍රෝටීන ප්‍රාවරයකින් ආවරණය වී පැවතීම

E. සමහරුන් ලිංගික ප්‍රජනනය සිදු කිරීම

44. විශේෂිත සංචරණ ව්‍යූහ දක්නට නොලැබෙන ජීවීන් වන්නේ

A. වැරහැලි පණුවා

B. ප්ලැනේරියා

C. කිරි පණුවා

D. ඒකාකු පණුවා

E. ගැඩවිල් පණුවා

45. උඩුකුරු පරිවහනය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය /ප්‍රකාශ මොනවාද?

A. සෛලම තුල ජල විභව අනුක්‍රමණය පීඩන අනුක්‍රමණයකි.

B. ප්‍රරෝහවල සිට මුල් දක්වා උත්ස්වේදන චූෂණය සම්ප්‍රේෂණය කිරීම සඳහා ජල අණුවල සංශක්තිය උපකාරී වේ.

C. සෛලම යුෂය ඉහල නැගීම සඳහා ශාකයට ශක්තිය වැය කිරීමට සිදු වේ.

D. සෛලම වාහිනී හා වාහකාභ තුල අඛණ්ඩ ජල කඳක් සෑදීමට ආශක්තිය වැදගත් වේ.

E. සෛලම යුෂය තුල ද්‍රාවණය වූ ඛනිජ පරිවහනයට ලක්වීම සඳහා විසරණය උදවු වේ.

46. පාතනෝද්භවය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය කුමක් ද?

A. බීජ රහිත ඵල ලබා ගත හැකිය.

B. ශාක වර්ධක ද්‍රව්‍ය භාවිතා කර කෘත්‍රිමව ප්‍රේරණය කරනු ලබයි.

C. සමහර තෘණවල සිදු වේ.

D. අණ්ඩ සෛලය ශුක්‍රාණුවක් සමග සංසේචනයක් සිදු නොවේ.

E. අනූනයෙන් ද්විගුණ අණ්ඩ සෛලයක් ඇතිවීම නිසා සිදුවිය හැකිය.

47. මිනිසාගේ පෙනහළු පරිමා හා ධාරිතා සම්බන්ධයෙන් නිවැරදි වන්නේ

A. ජීව ධාරිතාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් වේ.

B. කෘත්‍යානුගත ශේෂ ධාරිතාව ශේෂ පරිමාව හා අතිරේක ප්‍රාශ්වාස පරිමාවේ එකතුවට සමාන වේ.

C. මිනිසාගේ පෙනහළු ධාරිතාව 4500ml පමණ වේ.

D. මල අවකාශ වාතය යනු ගර්ත තුල පවතින කිසිවිටෙකත් වායු හුවමාරුවට සහභාගී නොවන වාත පරිමාව වේ.

E. සාමාන්‍ය ස්වසනයතදී දේහයට ඇතුළු කරගන්නා හා පිටකරන වායු පරිමාව 600ml පමණ වේ.

48. රක්තහීනතාව ඇතිවන්නේ විටමින් B සංකීර්ණයේ පහත කුමන විටමින් ඌනතාවයකින්ද?

A. කොබල් ඇමීන් (B_{12})

B. පිරිඩොක්සින් (B_6)

C. පැන්ටතෙනික් අම්ලය (B_5)

D. ෆෝලික් අම්ලය (B_9)

E. නියැසීන් (B_3)

22 A/L අපි [papers grp].

Scanned with CamScanner
Scanned with CamScanner
Scanned with CamScanner

49. අනුමස්තිෂ්කයේ කෘත්‍යයක් වන්නේ

A. කංකාල පේශී චලන සමායෝජනය ✓

B. දෘෂ්ටි හා ශ්‍රවණ ප්‍රතීක සමායෝජනය

C. දිවීම නැගීම වැනි දේහ චලන සමායෝජනය

D. චලන හැකියා ඉගෙනීම හා මතක තබා ගැනීමට උපකාරී වීම

E. සංවේදන තොරතුරු ලබා ගැනීම හා සංකලනය ✓

50. පුරුෂ ප්‍රජනක පද්ධතියේ හෝමෝනමය පාලනයේදී සටෝලි සෛල වලින් ස්‍රාවය වන ඉන්හිබින් වල කෘත්‍ය / කෘත්‍යයක් වන්නේ

A. පූර්ව පිටියුටරියෙන් FSH ස්‍රාවය උත්තේජනය

B. පූර්ව පිටියුටරියෙන් LH ස්‍රාවය උත්තේජනය

C. පූර්ව පිටියුටරියෙන් FSH හා LH ස්‍රාවය නිශේධනය

D. හයිපොතැලමසෙන් GnRH ස්‍රාවය නිශේධනය

E. ලේඩිග් සෛල වලින් ටෙස්ටොස්ටෙරෝන් ස්‍රාවය නිශේධනය

PAST PAPERS WIKI

Scanned with CamScanner

Scanned with CamScanner
Scanned with CamScanner